**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු.58,353 ක මුදල ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 හා 24 වගන්ති | ඝන මීටර් 159259 ක (පාරවල් 493 ක්) මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් 2012 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | ලේඛන යාවත්කාලීන කළ යුතුය. |

| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 316 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 19 | මූල්‍ය වටිනාකමක් ඇති දෑ ලේකම්වරයා භාරයේ පැවතිය යුතු නමුත් සභාවේ මුදල් අයකැමි භාරයේ සේප්පුව හා එහි යතුරු තබා තිබුණි. | මූල්‍ය වටිනාකමක් ඇති දෑ සේප්පුව තුළ තැන්පත් කිරීමටත් එහි යතුරු ලේකම් භාරයේ තබා ගැනීමටත් කටයුතු කරන බව. | මූල්‍ය වටිනාකමක් ඇති දෑ ලේකම් භාරයේ තැබිය යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 | 1999 වර්ෂයේ සිට අවස්ථා 04 ක දී ලබාදුන් එකතුව රු.18,400 ක් වූ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිටත් පියවා නොතිබුණි. | විස්තර සොයා ගත නොහැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත පරිදි අග්‍රිම පියවිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.69,426,137 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.69,748,149 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 24,110,000 | 17,437,155 | 12,140,000 | 82,094,329 | 18,430,000 | 20,802,543 | 12,490,892 | 76,797,174 |
| කුලී | 5,080,000 | 5,155,370 | 5,566,755 | 2,639,429 | 4,441,500 | 3,276,096 | 4,966,449 | 3,050,814 |
| බලපත්‍ර ගාස්තු | 961,000 | 1,277,896 | 1,190,466 | 900,080 | 1,260,150 | 1,050,304 | 847,514 | 812,650 |
| වෙනත් ආදායම් | 147,104,000 | 18,164,008 | 16,562,814 | 1,689,984 | 148,458,860 | 8,607,225 | 8,700,685 | 88,790 |
| | 177,255,000 | 42,034,429 | 35,460,035 | 87,323,822 | 172,590,510 | 33,736,168 | 27,005,540 | 80,749,428 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟය රු.80,749,428 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.87,323,822 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 29 ක් විය. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් රැස්කර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු.76,797,174 ක් වූ අතර, වර්ෂ අවසානයට හිඟ ශේෂය රු.82,094,324 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 13 ක් වැනි අඩු මට්ටමක පැවතුණි. | රතු නිවේදන නිකුත් කිරීම ද, නැවත ආරම්භ කරන ලද බව. | වරිපනම් බදු ආදායම් කඩිනමින් රැස් කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා කිසිදු වරිපනම් බදු මුදලක් ගෙවා නොමැති දේපල 18221 ක් පැවති අතර, එමගින් අය වියයුතු හිඟ වරිපනම් බදු වූ රු.9,281,060 ක මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයවීම ප්‍රමාණවත් පරිදි සිදු නොවී ඇති බව. | ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවේ ප්‍රධාන කාර්යාලයට හා උප කාර්යාලයට අයත් බලප්‍රදේශයන්හි පැවති වරිපනම් දේපල පිළිවෙලින් 13,300 ක් හා 9,652 ක් 2017 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට මේ දක්වා දිගින් දිගටම ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කර ඇති බව. | වර්තමාන තක්සේරු වටිනාකම මත ආදායම් අය කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ කුලී ආදායම රු.3,050,814 ක් වූ අතර, වර්ෂය අවසානයට රු.2,639,429 ක හිඟ ශේෂයක් අය වීමට පැවතුණි. එහි වර්ෂ 03 කට වඩා පැරණි රු.2,256,994 ක ශේෂයක් පැවතුණි. | ඉදිරියේ දී එම මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කුලී ශේෂයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 74 ක් වෙනුවෙන් රු.498,600 ක බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | බදු හා බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ආයතන 129 කින් අයවිය යුතු රු.183,560 ක හිඟ ශේෂ අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්ෂේත්‍රයට ගොස් මුදල් අයකර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | අදාළ ගාස්තු නියමිත පරිදි අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | වෙළඳ බලපත්‍ර හිඟ ශේෂය තුළ වර්ෂ 03 කට වඩා පැරණි රු.637,320 ක ශේෂයක් පැවතුණි. | තවදුරටත් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගත යුතුය. |
| (එ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.200,000 ක් හා මුද්දර ගාස්තු රු.171,179,307 ක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු හිඟ ශේෂ වාර්ෂිකව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික ස්ථාන 525 ක් පැවතිය දී ඉල්ලුම් පත් ඉදිරිපත් කල ව්‍යාපාරික ස්ථාන 29 කින් පමණක් කසළ එකතු කිරීම සිදුකර තිබුණි. | ඉඩකඩ ප්‍රමාණවත් නොවන ව්‍යාපාරික ආයතන වලින් පමණක් කසළ භාර ගැනීමට සිදු කරනු ලබන බව. | සමීක්ෂණයක් සිදුකර කසළ ගාස්තු අය කළයුතු ආයතන හඳුනා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ රු.2,549,201 ක ඉන්ධන වියදමක් දරා තිබුණු වාහන 04 ක් සඳහා GPS පද්ධතිය සවිකර නොතිබුණි. | කැබ් රථ, ත්‍රී රෝද රථය හා බැකෝ යන්ත්‍රය සඳහා GPS පද්ධතිය යොදා නොමැති බව. | සභාවේ සෑම වාහනයකටම GPS පද්ධතිය සවි කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර ස්ථාන මාරු වූ, මිය ගිය, වැඩ තහනමට ලක් වූ සේවකයින් 19 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට රු.352,750 ක මුදලක් අයකර නොතිබුණි. | ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |